කාමයේ වරදවා හැසිරීමෙන් තමන්ට හිමි කොටස ආදම්ගේ පුතණුවන්ට නියම කරන ලදී. කිසිදු සැකයකින් තොරව ඔහු එය හිමි කර ගනී. දෑස් වනාහි ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු බැල්ම හෙළීමය. දෙකන් වනාහි ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු ඇසීමය. දිව එය කාමයේ වරදවා හැසිරීම යනු කතා කිරීමය. අත, එය කාමයේ වරදවා හැසිරීම යනු ඇල්ලීමය. පාදය, එය කාමයේ වරදවා හැසිරීම යනු පියවර තැබීමය. සිත ආශා කරයි. ප්රිය කරයි. ලිංගික අවයව එය තහවුරු කරයි. එසේ නොවේ නම් එය බොරු කරයි.

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බව අබූ හුරය්රා - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි.
((කාමයේ වරදවා හැසිරීමෙන් තමන්ට හිමි කොටස ආදම්ගේ පුතණුවන්ට නියම කරන ලදී. කිසිදු සැකයකින් තොරව ඔහු එය හිමි කර ගනී. දෑස් වනාහි ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු බැල්ම හෙළීමය. දෙකන් වනාහි ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු ඇසීමය. දිව එය කාමයේ වරදවා හැසිරීම යනු කතා කිරීමය. අත, එය කාමයේ වරදවා හැසිරීම යනු ඇල්ලීමය. පාදය, එය කාමයේ වරදවා හැසිරීම යනු පියවර තැබීමය. සිත ආශා කරයි ප්රිය කරයි ලිංගික අවයව එය තහවුරු
කරයි. එසේ නොවේ නම් එය බොරු කරයි.))
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

හදීසයේ තේරුම: අල්ලාහ් කවරෙකු ආරක්ෂා කළේද එවන් අය හැර සැබැවින්ම මිනිසා කිසිදු සැකයකින් තොරව කාමයේ වරදවා හැසිරීමේ පාපයට පත් වන්නේය. පසුව නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා ඒ සඳහා උදාහරණ දැක්වූහ. දෑස් වනාහි ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු බැල්ම හෙළීමය. එනම්: කාන්තාවක් මහ්රම් නොවන්නියක්ව සිටිය දී ඇය දෙස අන්ය පිරිමියෙකු කාමාශාවෙන් තොරව බැලුව ද එය Zසිනා හෙවත් කාමයේ වරදවා හැසිරීමකි. එය ඇස සිදු කරන කාමයේ වරදවා හැසිරීමය. දෙකන්: ඒ දෙක කාමයේ වරදවා හැසිරීම යනු සවන් දීමය. එනම් කාන්තාවකගේ කතාවට සවන් දෙමින් රස විඳිමින් ඇයගේ කටහඬ තුළින් සතුටු වීම යන්නයි. මෙය කන සිදු කරන්නා වූ කාමයේ වරදවා හැසිරීමයි. අත: එය කාමයේ වරදවා හැසිරීම යනු ඇල්ලීමයි. එනම් අතින් හෝ ඊට සමාන යමකින් ස්පර්ශ කිරීම වේ. පාදය කාමයේ වරදවා හැසිරීම යනු තබන පියවරයි. එනම් අශීලාචාර ස්ථානයක් වෙත මිනිසා ගමන් කිරීමයි. උදාහරණයක් වශයෙන් කාන්තාවකගේ හඬට සවන් දී ඇය වෙත ගමන් කිරීම හෝ ඇයව බලන්නට යෑම. මෙයට කාමයේ වරදවා හැසිරීමේ ගණයට අයත් වේ. සිත ආශා කරයි, ප්රිය කරයි යනු කාන්තාවන් හා බැඳුණු කටයුත්තකට සිත නැඹුරු වීමයි. මෙය සිතෙන් ඇති වන කාමයේ වරදවා හැසිරීමය. ලිංගික අවයව එය සනාත කරයි. නැතිනම් එය බොරු කරයි. යනු ලිංගික අයවය කාමයේ වරදවා හැසිරෙන විට -අල්ලාහ් ආරක්ෂා කරත්වා- එවිට සැබැවින්ම එම අවයව කාමයේ වරදවා හැසිරී ඇති බව තහවුරු කරයි. තම ලිංගික අවයවය තුළින් එය කාමයේ වරදවා නොහැසිරුනද එය තහවුරු කරයි. නමුත් එය සුරක්ෂිතව තබා තම සිත ද පාලනය කළේ නම් එවිට එම

අවයව කාමයේ වරදවා හැසිරීම බොරුවක් බවට පත් වේ. මෙය කාන්තාවන් සමග බැඳී කටයුතු කිරීමෙන් වැළකී සිටින මෙන් වූ අවවාදය පෙන්වා දී ඇත. ඔවුන්ගේ කටහඬවලට සවන් දීම ඔවුන් දෙස බැලීම ඔවුන් ස්පර්ශ කිරීම ඔවුන් වෙත පියනැගීම සිත ඉක්මවා ගොස් ඔවුන් ගැන සිතීම. මේ සියල්ල කාමයේ වරදවා හැසිරීමේ වර්ග වේ. අල්ලාහ් අප ආරක්ෂා කරත්වා. බුද්ධිමත් යහපත් මිනිසා මෙකී අවයව, කාන්තාවන් හා බැඳුනු කටයුතුවලදී කාමයේ වරදවා හසුරවීමෙන් වළක්වා ගනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/8898